10/08/2011 - ලංකාදීප

**රටට ගැළපෙන පාලන ක්‍රමයක් - මිලින්ද මොරගොඩ**

යටත් විජිතවාදීන්ගෙන් මිදී රටට නිදහස ලැබීම සමග නිවහල් අලුත් යුගයක් බිහිකරන්නට අපට අවස්ථාව තිබිණ. එයට අරමුණක් රටට හා ඒ යුගයේ සිටි නායකයන් තුළ පැවති වග සැකයක් නැත. ආපසු හැරී බලන විට ප්‍රාර්ථනා කළ යහපත් අනාගතය බිහිවී නැත. දූ දරුවන් වෙනුවෙන් දියුණු සමාජයයක් සකස්කර සැනසිල්ලේ ගත කරන්නට ඇඟිලි ගනිමින් සිටි පරපුර අදටත් ඒ බලාපොරොත්තු සහිතව සිටී. ගත වූ දශක හය තුළ රට ගමන් කළ මාවත අවසානයේ දී බිහිවී ඇත්තේ තමන්ගේ අභිවෘද්ධිය තකා කවර ක්‍රමයකින් හෝ රටින් පළා ගොස් ස්වකීය පැවැත්ම සකස් කර ගැනීම අරමුණු කර ගත් සමාජයකි. පවතින ගැටුම් සහිත වෛර සහගත අන්තවාදී දේශපාලනය නිසා සිංහල, දෙමල හා මුස්ලිම් හැම ජාතියකට ම හැම ආගමකටම අයත් මහජනතාව තමන්ගේ පැවැත්ම උදෙසා විදේශ ගතවීමට ප්‍රයත්න දරති. තරුණ පරපුර රට හැර යාමට උනන්දු යුගයක අනාගතය කුමක්ද? දියුණු විදේශ රටවල් පවා ශ්‍රී ලාංකිකයන් දෙස බලන්නේ මව්බිමෙන් පැනයන්නට ප්‍රයත්න දරන කොටසක් වශයෙනි. බහුතරයක් නොවන නමුත් මේ ප්‍රයත්නය රටේ සමස්ථය ගැන ඇති ආකල්පයයි.

මෑත කාලය තුළ ගැටුම්, අරගල හා ත්‍රස්තවාදය අවසානයේ ගලාගිය රුධිර ගංගාව හරහා රටට නිසි ප්‍රයෝජනයක් ලැබිය යුතුය. නිශ්චිත වශයෙන් ම එය අලුත් ආරම්භයක් විය යුතුය. එය අපේක්ෂා දල්වන සමාජයකි. සියලු දෙනාට සාධාරණ අවස්ථා ඇති, යුක්තිගරුක යුගයක් බිහිවිය යුතුය. එය සමාජ එකඟතාවයෙන් හා කැපවීමෙන් දිනාගැනීමට හැකි විය යුතු හෙට දිනයකි.

නිදහස ලැබීමෙන් පසු උදා වූ කාල පරිච්ඡේදයේ දී නිසි ඉලක්කයට ගමන් කරන්නට නොහැකි වූයේ ඇයි? එය වටහා ගැනීම අද උදා වී ඇති අවස්ථාව ප්‍රයෝජනයට ගැනීමට අත්දැකීමකි. එදා රට තුළ බිහි වූ දේශපාලන සංස්කෘතිය හා අප අතර තිබුණ බෙදීම් එයට බෙහෙවින් බලපාන්නට ඇති බව නිසැකය. නිදහස සමග රටේ පාලනය භාරගත් කණ්ඩායම වරප්‍රසාද ලත් විශේෂිත පෙලැන්තියකි. මෙම පෙලැන්තිය බිහිවූයේ අධිරාජ්‍යවාදීන්ගේ උවමනාව අනුවය. මෙකී රදළ පෙලැන්තිය ගෙන ගිය වැඩ පිළිවෙල සාර්ථක එකක් වූවා නම් ජනවාර්ගික අරගලයක් ඇතිවී එය රටට විශාල හානියක් කරමින් පුපුරා යන්නේ නැත.

අලුත් අවස්ථාව උදා කර ගත යුතු අතීතය දෙස ආපසු හැරී බලමින්ය. එහි පාඩම් රටට ශක්තියකි. ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය කුමක්ද? එය අද දවසේ ද වැදගත් ප්‍රශ්නයකි. මේ සිංහල අපගෙ රටයි, කියන නමුත් මෙහි ජීවත්වන ජාතීන් ගණනාවකි. විවිධ ආගම් අදහන පිරිස් වෙසෙති. කුළ පසුබිම විශාල වශයෙන් සමාජය අභ්‍යන්තරයේ පවතී. මේ සියල්ල සමග එකට එකතු කරන අප තුළ සියලුම දෙනාගේ ම මාතෘ භූමිය යන අනන්‍යතාවය ගොඩනැගී තිබේද? එවැනි එකමුතුවක්, රට ගැන ආදරයක් නැති අවස්ථාවේ දී අනාගත දියුණුවක් ගැන වැඩි බලාපොරොත්තු තැබීම සාධාරණ නැත.

ඉන්දියන් සාගරයේ කුඩා දූපතක් වශයෙන් පිහිටි අප රටට අතීතයේ නොයෙකුත් බලපෑම්, අනුග්‍රහ හා ආක්‍රමණ වලට ගොදුරු වී තිබේ. ඉන්දියාවෙන් විජය කුමාරයා පැමිණි අතර එයින් පසු මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන පිරිස බුද්ධ ධර්මය ගෙන ආවේය. මේ අතීතය පෙන්වා දෙන්නේ ලාංකිකත්වය මිශ්‍රවීමේ පළමු පරිච්ඡේදයයි. ඒ වන විට මෙම දූපතේ සිටි පිරිස විජයගේ ආගමනය සමග අලුත් නායකත්වයකට නතු වූ අතර එයින් පැවත එන පරපුර බුදු දහම නිසා ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයකට ලක්වූ බව පැහැදිලිය. එක් එක් අවස්ථාවේ දී විවිධ ජාතීන් රටට පැමිණ තිබේ. වැඩි දෙනෙකු පැමිණ ඇත්තේ වෙළඳාමටය. චීන, මැදපෙරදිග, හා බටහිර කලාපයෙන් මෙම ආගන්තුකයන් රටට ප්‍රවේශ වී ඇත. ඉබන් බතූතා, අද්මිරාල් චින් හෝ, මාර්කෝ පෝලෝ, රොබට් නොක්ස් වැනි අය රටට පැමිණ ඇත. ටොලමිගේ ලෝක සිතියමට කුඩා ලංකාව අවධානයට ගැණුනේ මෙහි තිබුණ මුතු මැණික් ඇත් යන වෙළඳ ද්‍රව්‍ය සමග පැවති සම්බන්ධතා අනුවය. සෙරන්ඩිබ් යන නම පවා රටට ලැබී ඇත්තේ අරාබි වචනයකට අනුවය. අනපේක්ෂිතව හමුවූ යහපත් දෙයක් නමැති

අදහස දෙන සෙරන්ඩිපිටි යන්න අරාබි වෙළඳුන්ගේ ව්‍යවහාරයෙන් බිඳුන එකකි. ඉරානය වැනි රටවල අතීත ශිෂ්ටාචාරය අනුව පොලව අභ්‍යන්තරයෙන් පවත්වාගෙන ගිය ජල කළමණාකරණය ශ්‍රී ලංකාවට වැව් හා ඇල වාරි තාක්ෂණයක් සේ ලැබී ඇත. දාගැබ් ඉදිකරන්නට හා ශෛලමය ඉදිකිරීම් වලට අවශ්‍ය තාක්ෂණය බැහැරින් ඉගෙන ගෙන තිබේ. මේ සියල්ල රටට බාහිරව එකතු වූ උරුමයයි. අතීතයේ දී වෙළඳ රටක් වශයෙන් ප්‍රචලිතව තිබුණ බවට සාධක ඇති අතර අද සිංගප්පූරුව, ඩුබායි වැනි වානිජ නගර ඉටු කරන කාර්ය භාරය අතීතයේ ලංකාව ග්‍රිරූ වගකීම බව උපකල්පනය කිරීම සාධාරණය. මැද පෙරදිග, දකුණු හා නැගෙනහිර ආසියාවට දොරටුවක් වශයෙන් මුහුදු මාර්ග ෂමග ලංකාව සම්බන්ධ වී තිබුණ බවට සාක්ෂි තිබේ. රජවරු පවා විදේශිකයන් සමග ගනුදෙනු කර රට පෝෂණය කර ඇත.

බටහිර අධිරාජ්‍යවාදීන් ට වසර පන්සියයකට වැඩි කාලයක් යටත් වී පවතින්නේ ඉන් අනතරුවය. පෘතුගීසීන් පවා මෙරටට පැමිණියේ වෙළඳාමටය. බටහිර දියුණුවට මූලික වශයෙන් බලපෑවේ වෙළඳාමයි. ලංකාවේ වෙරළබඩ යටත්කරගත් පෘතුගීසීන් ස්වකිය අරමුණු අනුව ක්‍රියා කළේය. කතෝලික ආගම පැතිරවීය. සමාජය සමග සම්බන්ධ වූ අතර ලංකාවේ විසූ ඇතැමුන් නම් ගම් පවා වෙනස් කරගන්නා තරමට එහි බලපෑම තියුණු එකක් විය. ආගම පැතිරීම සමග රට තුළ තිබුණ අධ්‍යාපන රටාව වෙනස් විය. භාෂාවට අලුත් වචන එකතු වූ අතර සංස්කෘතික අංග ඇතුලු විය. ලෝකයේ බලවතුන් වශයෙන් නැගී සිටින රටවල් වෙනස්වීම සමග යටත් රාජ්‍ය වල රාමුව ද වෙනසකට ලක්වෙයි. ලන්දේසි පාලනයට ශ්‍රී ලංකාව යටත් වන්නේ ඒ අනුවය. පළමුවෙන් වෙළඳාම ට පැමිණි ලන්දේසි සමාගම් මෙරට පරිසරය හඳුනාගත් පසු එරට පාලකයෝ පෘතුගීසි පාලනයේ තිබුණ ප්‍රදේශ තමන් සතු කර ගත්හ. ලන්දේසි පාලන කාලයේ දී ද ලංකාවේ වෙනස්කම් සිදුවිය. මුහුදු ගමන් වලට අවශ්‍ය වරාය සකස්කළහ. ඔවුන්ගේ අනන්‍යතාව අනුව ගොඩනැගිලි ඉදිකරන්නට පටන් ගත්හ. අදටත් ඇතැම් වෙස්කම් සහිතව නමුත් මූලික අංග සහිතව පවතින රෝම ලන්දේසි නීතිය රටට හඳුන්වා දුන්නේය. ලන්දේසි බලපෑම සමාජයට කාවැදුනි. පෘතුගීසි හා ලන්දේසි පාලනය ලංකාවේ ආගම හා සංස්කෘතිය ට බරපතල හානි පැමිණවූහ. මෙම කාලයේ දී බෞද්ධ සාසනය පරිහානියට ලක් වූ අතර තායිලන්තය හා බුරුමය වැනි රටවලින් යළි උපසම්පදාව ලබන්නට තරම් එහි බලපෑම පැතිර ගිය බව සඳහන් කළ හැකිය. මෙකී රටවලින් පැමිණි උපසම්පදාව නිසා රට තුළ බුද්ධ දර්ශනයේ හා එහි සංස්කෘතික ලක්ෂණ තවත් මිශ්‍ර වූ බව සඳහන්කළ යුතුය. එදා රාජ්‍යත්වය විමසන විට රජවරු ස්වකීය විවාහය ට ගැලපෙන කාන්තාවන් වෙනත් ඉන්දියාවෙන් තෝරාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් සිංහාසනයේ උරුමය ලාංකිකයන්ගෙන් බැහැරට ගොස් ඇත. බුද්ධාගම හා දන්ත ධාතූන් වහන්සේ ගේ අයිතිය රාජ්‍යයේ පැවැත්මට සංකේතයක් වූ නමුත් පසුව මාලිගාව අවට හින්දු කෝවිල හා රජු දෙවියන් අදහන තත්ත්වයට පත්විය.

එංගලන්තයේ යටත් විජිතයක් වන්නේ මේ අතර කාලයේය.ලංකාවට අමතරව ආසියාවේ තවත් රටවල් අල්ලාගත් බ්‍රිතාන්‍ය ජාතිකයෝ තම නීති රීති සිරිත් විරිත් හා පාලන ක්‍රම රට තුළ වගා කළහ. ඉංග්‍රිසි කතා කිරීම හා සුදු පාලකයන් සමග සමීප ව සිටීම වරප්‍රසාදයක් විය. ක්‍රිස්තියානි ඇංග්ලිකන් නිකාය පැතිර ගියේය. නම්ගම් කුල ගොත් යළිත් වෙනස් විය. ලංකාවේ බාවිතා වූ ගම්මිරිස් වෙනුවට දකුණු ඇමරිකාවේ මෙක්සිකෝවෙන් මිරිස් ගෙන්වා හුරු කළ පෘතුගීසීහු මත්පැන් හුරු කළහ. ඉංග්‍රීසි පාලනයේ දී මෙරට පැවති වෙළඳ අනන්‍යතාව යටපත් කර වැවිලි ආර්ථිකයක් ඇති කළහ. කෝපි වගා කරන ලද අතර එයට රෝග ඇතිරෙන විට චීනයෙන් තේ ඇට ගෙනැවිත් වගා කළ අතර රබර් වගාව ද බිහි කළේය. වගාවට අවශ්‍ය කම්කරුවන් මෙරටින් සොයා ගත නොහැකි වූ විට ඉන්දියාවෙන් ගෙන ආවේය. එය නැවත වතාවක් බාහිර ජන කොටසක් ලංකාව සමග මිශ්‍රවීමකි. පෘතුගීසීන් හා ලන්දේසීන් මුතු මැණික් එකතු කරමින් කුරුඳු වෙළඳාමට නතු වූ නමුත් වෙළඳාම තමන් අතට ගත් ඉංග්‍රීසීන් කළේ සමාජය තමන්ට යටත් ලිපිකරුවන් බවට පත් කිරීමයි. කෙටි කාලයකට ප්‍රංශ ජාතිකයන් ද මෙරටට පැමිණ ඇති බව ත්‍රිකුණාමලයේ තැනක් ප්‍රංශය නමින් නම් කිරීමෙන් පෙනේ. අතීත ලංකාවේ අනන්‍යතාවය, සංස්කෘතිය හා ඇවතුම් පැවතුම් මිශ්‍ර වූ ආකාරය මෙවැනි කෙටි සටහනකින් විග්‍රහ කිරීම පහසු නැත. එය ඒ තරම් සියුම් හා බරපතල අන්දමින් සමාජය විනිවිද පැතිර ගියේය. ආකල්ප වෙනස් විය. විශේෂයෙන් බ්‍රිතාන්‍ය පාලකයන් රටේ ආකල්ප වෙනස් කළේය.

ෆ්‍රීන් පවතින පදනම ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය ලෙස අප කල්පනා කරන නමුත් මේ ආරක්ෂා කරන්නේ බ්‍රිතාන්‍ය ලක්ෂණ හා වෙනත් රටවලින් උකහා ගත් සම්ප්‍රදාය බව තේරුම් ගත යුතුය.

මෙවැනි පසුබිමක් මැද ලංකාවට ගරු කළ, ලංකාවේ බෞද්ධ දර්ශනය කෙරෙහි පැහැදුන ඇමරිකානු ජාතික සෙන්පති ඕල්කොට්, මාරි මියුසියන් හිගින්ස් වැනි බටහිර වියතුන් මෙරටට පැමිණ යළි ජාතික උරුව, බෞද්ධ ප්‍රබෝධය ඇති කළහ. ස්වදේශික නායකයන් සමග එක්වූ ඔවුහු නොයෙකුත් බාහිර ලක්ෂණ රටට හඳුන්වා දුන්නේය. කිතු බැති ගී වෙනුවට බොදු බැති ගී, වෙසක් කාඩ්, වෙසක් කූඩු, දහම් පාසල ඒ අතුරින් කිහිපයකි. මිශනාරී අධ්‍යාපනයට විකල්පයක් වශයෙන් බෞද්ධ දානපතියන් සම්බන්ධ කරගෙන බෞද්ධ අධ්‍යාපනය නැංවීය.

මෙම විදහා දැක්වීම අපට පෙන්වන්නේ අපේ මවුබිම ජාති, ආගම්, කුල හා සංස්කෘතික වශයෙන් විවිධ මිශ්‍රවීම් වලට ලක්වූ බවය. අද මෙරට ජනගහනයෙන් දහයෙන් එකක් විදේශ ගතව සිටී. කොටසක් ත්‍රස්තවාදී ප්‍රශ්න නිසා රට හැර ගිය අතර තවත් කොටසක් රට තුළ අවස්ථාව නැති නිසා වෙනත් රටවල රැකියා කරමින් ආදායමක් උපයා ගනිති. රට දියුණු වන විට මෙම පිරිස ට රට තුළ අවස්ථාව ලැබිය යුතු නමුත් ෆ්‍රීනට රටේ සංස්කෘතික හා සාමාජයීය මිශ්‍රවීමට රටින් පිටට යන කොටස ද දායකත්වයක් දරති. අතීතයේ අධිරාජ්‍යවාදය හරහා රට තුළ නොයෙකුත් රදල පංති ඇති කළ අතර දේශපාලන පක්ෂ වශයෙන් ද කතා කරන භාෂාව අනුව ද රට තුළ නොයෙකුත් බෙදීම් ඇති කළේය. දැන් එය රටින් බැහැර යන පිරිස හරහා ද සිදුවෙමින් පවතී. දේශපාලන පක්ෂ ක්‍රමය රටට ලැබුණේ බාහිර සමාජයෙන්ය. එහි ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග අන්තවාදී මට්ටමක් දක්වා අප ගෙන ගොස් තිබේ. පජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ සමාජ සම්මුතියක් තිබේ. පක්ෂ අතර මත වාද තිබෙන නමුත් ඒ මතවාද සම්මුතිය බිඳ රට හා සමාජය අපහසුතාවයට පත් කරන එකක් නොවේ. වර්තමානය මේ සියලු තත්ත්වයන්ට ගොදුරු වූ සමාජයකි. මේ සමාජ ක්‍රමය තුළ අසාධාරණකම් එමටය. අවාසනාවන්ත තත්ත්වයන් බහුලය. සාධාරණත්වය ගැන ප්‍රශ්න තිබේ. සියලු දෙනාට සාධාරණ අවස්ථා ඇතැයි ප්‍රකාශ කිරීම අසීරුය. දැන හැඳුනුම්කම්, බාහිර පසුබිම තීරණයක් ගන්නා හැම අවස්ථාවක ම ඉදිරියට පැමිණෙයි. සුදුසුකමට වඩා නොයෙකුත් අනවශ්‍ය බලපෑම් නිසා කොන් වන පිරිස වෛර කරන්නට පටන්ගනිති. පසුබෑමකට ලක්වන අතර වෑයම් කරන්නේ පවතින ක්‍රමය වෙනස් කර යුක්තිය සාධාරණත්වය ඇති කරන්නටය.

ත්‍රස්තවාදය තුරන් කිරීමෙන් පසු රට තුළ ඇති මෙම බෙදීම් හා ඒවා තුනීකර ජාතික එකමුතුව ඇති කරන්නට අවස්ථාවක් සකස් කර ගත යුතුය. නව යුගයක් උදා කර ගත හැකි ඒ අනුවය. ආත්ම ශක්තිය ඇති කර ගන්නට අවශ්‍යය. වෙනසක් වෙනුවෙන් සමාජය පොළඹවන බලවේගය නිර්මාණය කර ගත යුතුය. අතීතයේ භයානක සිදුවීම් අමතකකර සංවේදීව අලුත් යුගයක් කරා ගමන් කරන්නට කලාව, සංගීතය හා රසවින්දනයට කළ හැකි මෙහෙවරක් තිබේ. අපේ අනන්‍ය ජන සංගීතයක් ඇත. එය උසස් රස වින්දනාත්මක එකකි. රිද්මය අපට සමීපය. අපගේ කලා අංශ පවා පෙරදිග ඉන්දියාවේ සිට අපරදිග ලන්ඩන්, වොෂිංන්ටන් දක්වා ආකෘති වලින් මිශ්‍ර වී තිබේ. කලාව ලෝකයේ ඕනෑම රටක නිර්මාණ සාහිත්‍යයක් බිහිවන්නේ සමාජ සිදුවීම් සමගය. නිර්මාණ කරුවෝ ඒවා ප්‍රතිනිර්මාණය කරති. එයින් සමාජය ප්‍රකම්පනය වන අතර තමන් ගොදුරු වී සිටින අවාසනාවන්ත තත්ත්වය ගැන සිතන්නට පටන් ගනිති. එය පරිවර්තනයකට පදනමකි. අතීත සිදුවීම් අමතක කළ යුතු නැත. ගලා ගිය රුධිරය, ඒ රුධිරය ගලා ගිය හදවත් ගැන කතා කරන්නට අවශ්‍යය. එවිට සියලු පටු බෙදීම් අමතක කර නව්‍ය අරමුණු සහිත සමාජයක් දෙස අපේක්ෂා ෆ්‍රීල්විය හැකිවේ.

රට තුළ ජීවත් වන සියලු දෙනාම වැදගත් පුද්ගලයන්ය. ඒ හැම දෙනාටම අනනන්‍යතාවයක් ඇත. අප එකිනෙකාගේ සංස්කෘතියට අනන්‍යතාවයට ගරු කළ යුතුය. එක් අයෙකු උසස් හෝ තවත් අයෙකු පහත් වන්නේ නැත. උපතින් එසේ නොවන බව බුදු දහම පෙන්වා දී තිබේ. බුද්ධ දර්ශනය රටේ ආධ්‍යාත්මයට කිඳා බැස ඇති රටක තවත් ජන කොට්ඨාශයක් නිගරුවට පත්වන අන්දමට හැසිරෙන්නේ කෙසේද? තවත් බෙදීම් ඇතිකරන අන්දමට ක්‍රියාකරන්නේ මන්ද? මේ පැති ගැඹුරෙන් සාකච්ඡා කිරීම අප සියලු දෙනාගේ වගකීමකි.

යුද පරිසරයට පසු රට ගොඩ නැගීම හ්වඑසදබ ඊමසකාසබට යන්න ගැන අප අවධානය යොමු කළ යුතුය. ශ්‍රී ලංකාවේ සංස්කෘතිය, ආගම හා දේශපාලනයට ඉන්දියාවේ බලපෑම අතීතයේ සිට අද දක්වා මහා සාධකයකි. ආසියාවේ පහළ වූ ශ්‍රේෂ්ඨතම කවියෙකු හා චින්තකයෙකු වශයෙන් සැලකෙන රවීන්ද්‍රනාථ ඨාකූර් මැති තුමා වරක් රට තුළ ස්වදේශීකත්වය හා ජාතික එකමුතුව ඇතිකිරීම ගැන කතා කර තිබේ.

We have no word for nation in our language. When we borrow this word from other people it never fits us. The Bengali word *rastra* is used to indicate a state or a large political unit but has no cultural connotations. The term des was often used to refer to either to Bengal or to India but the term originally meant the place of origin, place of geographic, social, linguistic and cultural sense and the equivalent for our country, home and place.

ඨාකූර් තුමා පෙන්වන්නේ nation යන අර්ථය ඇති වදනක් ගැනය. රාශ්ඨ නොවසේ නම් රට යනු දේශ සීමා පෙන්වන අරුතකි. දේශ සිමා පවුරු පදනම් වලට එපිටින් ඇති අප සියලු දෙනාම යන අදහස ඇති අලුත් සංකල්පයක් අවශ්‍ය බව ඉන්දියානු මහා විද්වතා විග්‍රහ කර තිබේ. එය අපට හොඳින් ගැලපේ. අද පවතින ගැටුම් විසඳා ගන්නට ඇති මග දකින්නට මෙම දර්ශනය වටහා ගැනීම වටී.

අප සියලු දෙනාටම එකතු වී රට ගොඩනගා ගැනීමට අවශ්‍යය. ආර්ථික වර්ධයකට මග පාදා ගත හැකි වන්නේ සමාජයේ එකමුතුවකින් පමණකි. එයට මග පෙන්විය හැකි නිසි නායකත්වයකටය. දේශපාලන සහාය අනිවාර්ය සාධකයකි. අප සියලු දෙනා එකට ජීවත්වන, එක අරමුණකින් ක්‍රියා නොකරන තත්ත්වයකට තල්ලු වුවහොත් යළිත් පිපිරීමකින් කෙළවර විය හැකිය. එවැනි අවාසනාවන්ත තත්ත්වයක් ඇතිවුවහොත් අතීතයට වඩා භයානක වීම වැලැක්විය නොහැකිය. බේධ පතුරවා සමාජය බෙදා තාවකාලිකව ජය ගැනීමට හැකි නමුත් එය සමස්ථ සමාජය දිනන මාවතට අවතීර්ණ වීමක් නොවේ.

සිවිල් සමාජය සියලු ප්‍රශ්න වලට ආණ්ඩුවෙන් විසඳුම් අපේක්ෂා කරති.සමාජ ප්‍රශ්න වලට රජය පමණක් විසඳුම සකස් කිරීම යෝග්‍ය නැත. අලුත් සමාජ සම්භවයක් උදෙසා ගැලපෙන ක්‍රමයට උල්පත අප ජීවත්වන සමාජය තුළින්ම හට ගැනීම අවශ්‍යය. ආගමික හා සිවිල් සමාජ නායකයින් ට එයට සැලැස්මක් සකස් කළ හැකිය. මහජනතාව තමන්ගේ ආකල්ප හෙළිකරන ක්‍රමයක් මහජන කොමිසමක් වැනි යාන්ත්‍රණයක් ඇතිකිරීම මගින් අතිකිරීම උචිතය. ජාතීන් අතර සහයෝගීතාවය, අවබෝධය හා සියලු දෙනාට එකිනෙකාගේ තත්ත්වයන්ට ගරු කරන සැනසිලිදායක සමාජයක් ඇති කරන්නට අනුගමනය කළ  යුතු ප්‍රතිපත්ති ගැන මෙහිදී එකඟතාවයකට පැමිණිය හැකිය. රට තුළ ජීවත්වන අප සියලු දෙනාම සර්ව පිරිසිදු නැත. අප සියලු දෙනා අතරින් වැරදි තීරණයකට පැමිණ නැති කිසිවෙකු ද නැත. ආපසු පැරණි අවාසනාවන්ත යුගය කරා ගමන්කිරීම වෙනුවට අනාගත පරපුරට සමෘද්ධිමත්  යුගයක් උදා කිරීමට අවශ්‍ය පදනම සකස් කිරීමට අද වගකීමක් ඇත.

එදිනෙදා ජීවිතයේ දියුණුව ගැන අවධානය යොමු කරනවා සේ ම අනාගතයේ පැවැත්ම ගැන ද සිතන්නට කාලය උදා වී තිබේ. රට එකතු කර රටේ ජීවත්වන සියලු දෙනා ම අභිමානයෙන් වෙසෙන සමාජයක් ඇති කිරීමට ඓතිහාසිකව උදා වී ඇති අවස්ථාව කෙරෙහි පුළුල් සමාජ කතිකාවතක් ඇරඹීම අවශ්‍යය. ලෝකය පුරා සිදුවන දේ සලකා රට තුළ අනන්‍යතාවය ගොඩනගන අප රටට ගැලපෙන ක්‍රමයක් බිහි කිරීමෙන් සමස්ථ සමාජය ම ඉහළට ඔසවා තැබිය හැකිවෙයි.